# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2099/36 - 2018 නොවැම්බර් මස 30 වැනි සිකුරාදා - 2018.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 11/3/3/1/32B.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: LD/05/2010/MV/54.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1994 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ, E 389 රඹුක්ඔළුව වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2018.11.14 දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13 හි, අතිරේක අංක 98 හි, පත්‍ර අංක 249 දරන සැළැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.1723 ක් වන පහත විස්තර සඳහන් ඉඩම:

01. **කැබලි අංක 9578**

ඉඩමේ නම: ගල්වංගෙඩිය කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: පෞද්ගලික; භුක්තිකරු: ලග්ගල පල්ලේගම, රඹුක්ඔළුව පදිංචි ඉහළ ගෙදර පුංචි බණ්ඩා; ප්‍රමාණය; හෙක්ටයාර් 0.1723.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.01.04 වැනි දින, පෙ.ව. ......ට, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 දෙසැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එස්.ඩී.පී. ජයසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල කොට්ඨාසය.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-391